සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# දෙවන වාර පරීක්ෂණය 2019
## තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

**9 ශ්‍රේණිය** **කාලය පැය 1 ½ යි**

| නම/ විභාග අංකයඃ |
|---|

- **සියලුම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්ණ පත්‍රයේම පිළිතුරු සපයන්න.**

---


(01) පහත දී ඇති පද ලැයිස්තුව කියවා හිස් තැන් පුරවන්න.

(TB-ටෙරා බයිට, GHz-ගිගා හර්ට්ස්, ප්‍රධාන මතකය, විශ්ව ශ්‍රේණිගත බස් කෙවෙනිය, සැනෙළි ධාවකය HDMI කෙවෙනිය, )

1. සකසනයේ වේගය ........................................................................ මගින් ප්‍රකාශ කරනු ලැබේ.
2. දෘශ්‍ය චිත්‍රක අනුහුරුකුරු(VGA) කෙවෙනිය වෙනුවට නූතන පරිගණක වල අද බහුලව භාවිත කරන කෙවෙනියක් ලෙස ........................................................................ හැඳින්විය හැකිය.
3. පරිගණකයක බාහිර ආචයන උපාංගයක් ලෙස .................................................... භාවිත වේ.
4. දෘඪ තැටියක ධරිතාවය මැනීමට ........................................................... ඒකකය භාවිත කරයි.
5. ................................ තුල තැන්පත්ව ඇති දත්ත විදුලිය විසන්ධි වීමත් සමග මැකීයාම සිදුවේ.

(02) පහත සඳහන් පර්යන්ත උපාංග නම් කර ආදාන උපාංග, ප්‍රතිදාන උපාංග, සහ ආචයන උපාංග ලෙස ඒවා වගු ගත කරන්න.


(ඉංග්‍රිසි අක්ෂරය හා නම වගුවෙහි අදාල තීරුවේ ලියන්න) (ලකුණු 30)



| ආදාන | | ප්‍රතිදාන | | ආචයන | |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

(03) පහත දක්වා ඇත්තේ විද්‍යුත් පැතුරුම්පත් මෘදුකාංගයක අතුරු මුහුනතක කොටසකි. එහි A සිට E දක්වා ලේබල් කර ඇති කොටස් නම් කරන්න. (ලකුණු 10)

(කෝෂය, වැඩ පත, පේළිය, නාම කොටුව, තීරුව, Home මෙනුව)




A............................................................................................

B............................................................................................

C............................................................................................

D............................................................................................

E............................................................................................

(04) නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(1) පරිගණකයක් මිලදී ගැනීමේදී සැලකිය යුතු මූලික තාක්ෂණික පිරිවිතරයක් වන්නේ

i. වගකීම යි

ii. අලවියෙන් පසු සේවාව යි

iii. මතක ධාරිතාව යි

iv. සමාගමේ කීර්තිනාමය යි

2. විද්‍යුත් පැතුරුම්පතක යොදා ගන්නා සරල ශ්‍රිතයක් නොවන්නේ කුමක්ද?

i. =SUM ii. =AVERAGE iii. =TOTAL iv. =MIN

3. පරිගණකයක ප්‍රධාන ආචයන උපාංගය ලෙස හැඳින්විය හැක

i. දෘඪ තැටිය ii. සකසනය

iii. සංගෘහිත තැටිය iv. සංඛ්‍යාංක බහුවිධ තැටිය

4. යම් කිසි උපදෙස් මාලාවක් නැවත නැවත ක්‍රියාත්මකවීම නිරූපණය කරනු ලබන පාලන ව්‍යුහය සහිත පරිගණක ක්‍රමලේඛ හඳුන්වන්නේ

i. තේරීම සහිත ක්‍රමලේඛ ලෙසය. ii. පුනර්කරණය සහිත ක්‍රමලේඛ ලෙසය.

iii. අනුක්‍රමය සහිත ක්‍රමලේඛ ලෙසය. iv. බහුතේරීම සහිත ක්‍රමලේඛ ලෙසය.

5. අරාව භාවිත කර ක්‍රමලේඛ නිර්මාණය කිරීමෙන් සිදු වන්නේ


i ක්‍රමලේඛය සංකීර්ණ වීමයි

ii. තනි විචල්‍යයක් වෙනුවට විචල්‍ය කිහිපයක් භාවිත වීමයි

iii. ක්‍රමලේඛය විශාලත්වය වැඩි වීමයි

iv. ක්‍රමලේඛයේ උපදෙස් ප්‍රමාණය අවම වීමයි (ලකුණු 10)

(05) පහත දක්වා ඇත්තේ කිසියම් සංඛ්‍යාවක් ඔත්තේද, ඉරට්ටේද යන්න සොයා ගැනීම සඳහා භාවිත කළ හැකි ගැලීම් සටහනකි. A සිට E දක්වා හිස් තැන් පිරවීමට සුදුසු පද වරහන් තුළ දී ඇති වචන ලයිස්තුවෙන් තෝරන්න. (ලකුණු 10)




(ශේෂය බිංදුව වේද?, සංඛ්‍යාව ආදානය කිරීම, අවසානය, නැත, ඔව්, ඔත්තේ සංඛ්‍යාවකි, සංඛ්‍යාව ආදානය කිරීම )

A……………………………………………………………………………………….

B……………………………………………………………………………………….

C……………………………………………………………………………………….

D……………………………………………………………………………………….

E……………………………………………………………………………………….

(06) පහත දක්වා ඇත්තේ 9 ශ්‍රේණියේ ICT ගුරුතුමිය විද්‍යුත් පැතුරුම්පත් පාඩම පුනරීක්ෂණය කිරීම සඳහා යොදාගත් පළමු වාර විභාගයේ ලකුණු ලයිස්තුවෙන් වෙන්කර ගත් කොටසකි. ඒ ආශ්‍රයෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. (ලකුණු 10)

E2 | fx

| | A | B | C | D | E | F |
|---|---|---|---|---|---|---|
| 1 | Student | Mathematics | English | Science | Total | Average |
| 2 | Subha | 88 | 80 | 65 | | |
| 3 | Pasan | 75 | 64 | 89 | | |
| 4 | Nilu | 76 | 90 | 65 | | |
| 5 | Namal | 83 | 65 | 78 | | |
| 6 | | | | | | |

1. සුභාගේ මුළු ලකුණු E2 කෝෂයට ලබා ගැනීම සඳහා භාවිත කළ යුතු ශ්‍රිතය ලියා දක්වන්න.

   ..........................................................................................................................

2. සුභාගේ මුළු ලකුණු වල සාමාන්‍යය F2 කෝෂයට ලබා ගැනීම සඳහා භාවිත කළ යුතු ශ්‍රිතය ලියා දක්වන්න.

   ..........................................................................................................................

3. ගණිතය විෂයය සඳහා සිසුවෙකු ලබා ගෙන ඇති උපරිම ලකුණ B6 කෝෂයට ලබා ගැනීම සඳහා භාවිත කළ යුතු ශ්‍රිතය ලියා දක්වන්න.

   ..........................................................................................................................

4. ඉංග්‍රීසි විෂයය සඳහා සිසුවෙකු ලබා ගෙන ඇති අවම ලකුණ C6 කෝෂයට ලබා ගැනීම සඳහා භාවිත කළ යුතු ශ්‍රිතය ලියා දක්වන්න.

   ..........................................................................................................................

5. ගණිතය, විද්‍යාව සහ ඉංග්‍රීසි විෂයය සඳහා එක් එක් සිසුවා ලබා ගෙන ඇති ලකුණු රූප සටහනකින් දැක්වීමට සුදුසු ප්‍රස්ථාර වර්ග දෙකක් නම් කරන්න.


   ..........................................................................................................................

(07) (i) පාසලක තිස්ස, විජය, ගැමුණු සහ පරාක්‍රම වශයෙන් නිවාස 4 ක් ඇති බව සලකන්න. සිසුන් නිවාස වලට වෙන් කිරීම සඳහා යොදා ගත හැකි ගැලීම් සටහනක් පහත දැක්වේ. මෙහි දී ඇතුළත්වීමේ අංකය 4 න් බෙදා ඉතිරිය අනුව නිවාසය පහත දැක්වෙන පරිදි තීරණය කෙරේ.

- ඉතිරිය 0 නම් තිස්ස නිවාසය,
- ඉතිරිය 1 නම් විජය නිවාසය,
- ඉතිරිය 2 නම් ගැමුණු නිවාසය,
- ඉතිරිය 3 නම් පරාක්‍රම නිවාසය වශයෙනි.

දී ඇති ගැලීම් සටහනෙහි A සිට E දක්වා හිස් තැන් පිරවීමට සුදුසු පද වරහන් තුල දී ඇති වචන ලයිස්තුවෙන් තෝරන්න.

(තවත් සිසුහුසිටිත් ද?, ''තිස්ස''පෙන්වන්න, නිමාව, ඉතිරිය = 2 ද, ඇතුළත්වීමේ අංකය ලබා ගන්න) (ලකුණු 10)




A ………………………………………………………………………………….


B ………………………………………………………………………………….

C ………………………………………………………………………………….

D ………………………………………………………………………………….

E ………………………………………………………………………………….

(ii) පාසලේ සිටින සියලු ම සිසුන් නිවාසවලට වෙන් කර දැක්වීමට අඳින ලද ගැලීම් සටහනට අදාළව සංවර්ධනය කරන ලද Scratch ක්‍රමලේඛයේ හිස්තැන්වලට පහත දී ඇති උපදෙස් කාණ්ඩ ඇතුළත් විය යුතු ආකාරය ඊතල මගින් යා කර දක්වන්න. (ලකුණු 10)



## පිළිතුරු පත්‍රය

(01) 1. GHz-ගිගා හර්ට්ස් 2. HDMI කෙවෙනිය 3. සැනෙලි ධාවකය
4. TB-ටෙරා බයිට 5. ප්‍රධාන මතකය

(02)

| Input | | Output | | Storage | |
|---|---|---|---|---|---|
| D | මූසිකය | A | ප්‍රොජෙක්ටරය | F | දෘඪ තැටිය |
| E | යතුරු පුවරුව | B | මොනිටරය | I | සැනෙලි ධාවකය |
| H | මයික්‍රොෆෝනය | C | නාදකය | J | සුසංහිත තැටිය |
| | | G | ප්‍රින්ටරය | | |

(03) A – නාම කොටුව B- කෝෂය C- පේළිය D- තීරුව E – වැඩ පත

(04)

| | |
|---|---|
| 1. | iii |
| 2. | iii |
| 3. | i |
| 4. | ii |
| 5. | iv |

(05) A - සංඛ්‍යාව ආදානය කිරීම B - ශේෂය බිංදුව වේද?
C – නැත D - ඔත්තේ සංඛ්‍යාවකි E- අවසානය

(06) 1. SUM 2. Average 3. Max 4. Min 5. Bar chart / Column chart

(07) i. A - ඇතුළත්වීමේ අංකය ලබා ගන්න B - ''තිස්ස'' පෙන්වන්න
C – ඉතිරිය=2 ද D - තවත් සිසුහු සිටිත් ද? E- අවසානය

ii.

